# ඓතිහාසික ශිලා ලේඛනමය ගිවිසුම් හා නූතන ගිවිසුම් නීතියේ මූලිකාංග පිළිබඳව සන්සන්ධනාත්මක අධ්‍යයනයක් (සංගමු විහාර ලිපිය ඇසුරින්)

උදය නෙලුම් රත්නායක
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
nelukit@sjp.ac.lk

ශ්‍රී ලාංකේය ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා මූලාශ්‍රය විශේෂයක් ලෙස අභිලේඛන සාධක යොදා ගැනේ. සාහිත්‍ය මූලාශ්‍රමය තොරතුරු සනාථ කිරීම, නිශ්ප්‍රභා කිරීම, ඌණ පූර්ණ සැපයීම, නව්‍ය තොරතුරු අනාවරණය කර ගැනීම අභිලේඛනයන් හි ප්‍රමුඛ කාර්යයෝ වෙති. දැනට පිළිගෙන ඇති පරිදි ක්‍රි.පූ 03 වැනි සියවස ආසන්නයේ සිට මෙරට හමුවන මුල් කාලීන බොහෝ සෙල්ලිපි ආගමික තොරතුරු සඳහා සීමාවුවත් කල්යත්ම මෙරට දේශපාලන, සමාජීය, ආර්ථික හා සංස්කෘතික තොරතුරු ඒවායේ අන්තර්ගත විය. අනුරාධපුර අවධියේ සිට ක්‍රමිකව විකාශයනය වූ මෙම සෙල්ලිපි පොළොන්නරුව යුගය වනවිට ප්‍රමාණාත්මකව ද අන්තර්ගතයෙන් ද විශාලවන්නට විය. රාජ්‍ය අධිකාරිය පනවන ලද නෛතික ලේඛන විශේෂයක් ලෙස සෙල්ලිපි සැලකේ. රජයේ පාලන ප්‍රතිපත්ති, ආර්ථික ප්‍රතිපත්ති නීති ප්‍රකාරව ජනතාව වෙත සන්නිවේදනය කිරීමට මෙම සෙල්ලිපි යොදාගෙන ඇති බව අධ්‍යයනයන් තුළින් තහවුරු වී ඇත.
ක්‍රි.ව 12 වන සියවසට කාලනිර්ණය කොට ඇති සංගමු විහාර ශිලාලේඛනය මෙරට ඉතිහාසයේ වැදගත් ඓතිහාසික ලේඛනයක් ලෙසින් අධ්‍යයනයන් තුළ යොදා ගැනේ. පොළොන්නරුව යුගයේ දෙවන ගජබාහු රජු හා පළමු පරාක්‍රමබාහු කුමරු අතර ඇතිවූ සමගි සන්ධානයක් මෙම ලිපියේ අන්තර්ගත වේ. මෙම ලිපිය පිළිබඳ අධ්‍යයනය කර ඇති විද්වතුන් මෙරට ඉතිහාසයේ දැකගත හැකි ගිවිසුම් ප්‍රකාර නෛතික ලේඛනයක් ලෙසින් මෙය හඳුන්වාදී තිබේ. මෙම අධ්‍යයනයේ දී එකී ලිපියෙහි අඩංගු මූලික කරුණු වර්තමානයේ මෙරට ක්‍රියාත්මක වන ගිවිසුම් නීතියේ මූලිකාංග සමග සන්සන්ධනාත්මකව අධ්‍යයනය කිරීම මුඛ්‍ය අරමුණ වේ. පැරණි ගිවිසුමක් නිර්මාණය වීමේ පසුබිම අඛණ්ඩත්වයෙන් යුක්තව වර්තමානය දක්වා විකාශනය වී තිබේ ද යන්න මුඛ්‍ය පර්යේෂණ ගැටලුව ලෙසින් සාකච්ඡා වේ. මෙය ගුණාත්මක විශ්ලේෂණ අධ්‍යයන ක්‍රමවේදයට සිදු කෙරෙන අතර මෙහිදී යොදා ගැනෙනුයේ සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, නීතිමය ලේඛන පදනම් කරගත් සන්සන්ධනාත්මක අධ්‍යයනයකි. එහිදී ගිවිසුමක් නිර්මාණය වීමට අදාළ නූතන සංකල්ප සමග අතීත කරුණු සන්සන්ධනය කෙරෙන අතර ඒවායේ ඇති සමවිෂමතා කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කෙරේ. බොහෝ දුරට නූතන ගිවිසුම් නීතියේ මූලිකාංග කිහිපයක් ම සංගමු විහාර ලිපිය තුළ අන්තර්ගත වන බව අධ්‍යයනය තුළින් පැහැදිලි විය.

**මුඛ්‍ය පද -** ගිවිසුම් නීතිය; තෝරත නීතිය;පොළොන්නරුව;රෝම ලන්දේසි නීතිය; සංගමු විහාර ලිපිය,